# "අල්ලාගෙන මගෙ පුංචි අතින්"



# පුංචි හපනා මහීෂ ගමගේ

ජගත් ජේ එදිරිසිංහ

මේ සිසිල් උදෑසන සුගන්ධවත් කරමින් මල් කැකුළු පිබිදෙන්නට වෙර දරන වේලාවයි. මම මහීෂ විදුරංග ගමගේ පුතා ගේ නවතම ගී අඩංගු සංගත තැටියට සවන් දෙමින් සිටිමි. මේ ළමා ගායකයාගේ ප්‍රතිභාන්විත ගායනයෙන් ඔපවත් වූ ඒ ගී ද්විත්වයේ අපූර්වත්වය මා සිත වසඟ කර ගනියි. සැබැවින්ම ඒ ගායනය විශිෂ්ට ය.

අල්ලාගෙන මගෙ පුංචි අතින්
මේ ආ ගමනේදී
වටපිට පෙන්නා දී
මගතොට හඳුනා දී
පාර කියා දුන්නේ.. තාත්තේ
ඔබයි පුංචි කාලේ

සිසිර දිසානායක ප්‍රවීණ ගීත රචකයා අතින් ලියැවී තරුපති මුණසිංහ අතින් සංගීතවත් වූ ඒ ගීයට සිය හඬින් පණ පොවන මහීෂ අපට පෙන්වා දෙන්නේ අපේ සමාජයේ දරුවන් කෙතරම් කුසලතාපූර්ණ ද යන්න නොවේද?

බෙරික් ග්‍රැමර් පාසලේ අට වන ශ්‍රේණීයේ ඉගෙනුම ලබන මහීෂ අපත ලබන්නේ සිංගප්පූරුවේදීය. වයස අවුරුදු හයේදී ඔහු ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වෙයි. ඒ 2005 වසරේදී ය. එතැන් සිට මහීෂ මේ යන ගමන අපේ අනෙක් දරු දැරියන්ටද ආදර්ශයකි.



වැඩිහිටියන්ගේ පෙම් ගී වේදිකා මත ගායනා කරවා තම දරුවන් ළමා සුපර් ස්ටාර්ලා බවට පත් කරවනු ලබන ශ්‍රී ලංකාවේ දෙමාපියන් මහීෂ වැනී දරුවන්ගෙන් යමක් ඉගෙන ගත යුතු ය

ඔහු ශාක්‍යමුණි බෞද්ධ විහාර දහම් පාලේ සහ කවතා සිංහල භාෂා පාසලේ ශිෂ්‍යයෙකි. නිවැරදි ලෙස සිංහල බස හසුරුවන්නට මහීෂට මග පෙන්වීම ලැබෙන්නේ ඒ තැන් වලදී ය. (සිංහල දූරුවට සිංහල කතා කරන්නට මේ දරුවා හැඩ ගැස්සූ ඒ ගුරුවරුනට ගුරුවරියනට සහ දෙමාපියන්ට යහපතක්ම වේවා) මහීෂ 2008 වසරේදී තරුපති මුණසිංහ ගුරුතුමා යටතේ සංගීතය හැදෑරීම අරඹන්නේ සංගීතය පිළිබඳ සිය සහජ හැකියාව තවත් ඔප් නංවා ගනු පිණිස ය.

ලක්හඬ ගුවන් විදුලියේ ළමා හුරුව, ප්‍රනාම, සිසිර දිසානායකගේ අතුරු මිතුරු, සෝබාව දේ වැනි ප්‍රසංග සඳහා දායකත්වය දුන් මහීෂ තරුපතිගේ සංගීත මෙහෙයුම යටතේ හඳුනාගත්තොත් ඔබ මා ප්‍රසංගයේදී තනිවම ගායනා කළ "දෙවෙනි බුදුන් ලෙස" ගීයෙන් මහත් පැසසුම් ලබා ගත්තේය. සුනිල් එදිරිසිංහ හා දීපිකා ප්‍රියදර්ශණී ගේ අහසයි ඔබ මට ප්‍රසංගයේ අත්වැල් ගායනයට පවා හවුල්වන්නට පුංචි මහීෂට හැකි වන්නේ ඔහුගේ ගායන හැකියාවේ ශක්තිය නිසාම ය.

මහීෂ ගේ ගමන් මග තවත් එළි පෙහෙළි වෙමින් ඔහු National Children's Choir & Youth Chorale of Australia (NCCA) හි සාමාජිකයකු බවටද පත්වන අතර දකුණු නිදහස් පාසල් සංගීත ප්‍රසංගයේ Southern Independent Schools (SIS) Musical Concert දී බෙරික් ග්‍රැමර් පාසල නියෝජනය කරන්නටද තේරී පත්වෙයි.

මේ සියල්ල අතරේ මහීෂ දක්ෂ ගිටාර් වාදකයකු ද වෙයි.

සංගීතයට පමණක් කොටු නොවන මහීෂ බෙරික් ස්ප්‍රිංග්ස් ක්‍රිකට් කණ්ඩායමේ සාමාජිකයකු ලෙස ක්‍රිකට් පිටියටද බසියි. පසුගිය වසරේ එම කණ්ඩායමේ වයස 15න් පහළ හොඳම පන්දු යවන්නා ලෙස සම්මානයට පාත්‍රවන්නේද මහීෂ ය.

මගෙ මව්බිම සිරිලකයි
උපතින් අපි පින්බරයි
මගෙ මව්බස සිංහලයි
සුකොමල අකුරින් හැඩයි

සුනිල් සරත් පෙරේරා ශූරීන් අතින් ලියැවුණ ගීය මහීෂගේ හඬින් දැන් මට ඇසෙයි. අපේ දරුවන් උස් මහත්විය යුත්තේ අපේ අනන්‍යතාව රැකගෙනය යන්න සැබෑවක් බවට පත් කරන්නට මේ පුංචි හපනා සමත්වී ඇති සැටි ඇසෙන අපේ ඇසට කඳුලක් නැගෙයි. ඒ සතුටට ය.

සිහිල් මන්ද මාරුතය මහීෂ ගේ ගී හඬ පරිසරයට මුදා හරියි. ඒ ගී හඬ අසමින් දහසක් මල් කැකුළු පිදෙන්නට වෙර දරයි. මේ කැකුළු ඉතා ඉක්මණින් පිබිදෙන බව නිසැකය. අපි ඒ දෙස බලමින් උද්දාමයට පත් වෙමු. මන්ද අපේ අනාගතය මේ සිගිති මල් කැකුළු විසින් සරසනු ලබන බැවිනි.

**නිවාඩුවට වෙනසක්**

Villa 16 Hikkaduwa

ලංකාවේ නිවාඩු ගත කරන්නට යන ඔබට ලෝ ප්‍රකට හික්කඩුව සුන්දර මුහුදු වෙරළ පිසගෙන එන සිසිල් මන්ද මාරුතයේ පහස විඳිමින් නිවාඩු නිකේතනයක සොදුරු බව හිමි, සියළු පහසුකම් සහිත අංග සම්පූර්ණ අපූරු නිවසක විවේකයක් විනෝදයක් සමග නිවාඩු ගත කරන්නට විමසන්න.

**සනත්: (03) 8774 2408**
0422 233 009
sanathku@yahoo.com

හික්කඩුව නගර මධ්‍යයේ මුහුදු වෙරළට ඇවිදින දුරින්
විදුලි උපකරණ සහ ගෘහ භාණ්ඩ සමගින්
Wi Fi අන්තර් ජාල පහසුකම්
අපගේ වෙබ් අඩවිය www.villa16hikkaduwa.com

**සියලුම ජෝතිශ්‍ය කටයුතු**

දෙස් විදෙස් කේන්ද්‍ර සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සීහුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මඟහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විභාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම....
දල, සිරිපති, ක්‍රිෂ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

*ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා.......*

රහස්‍යභාවය සුරකිමු

**සුබෝධා ජෝතිශ්‍ය සේවය**

www.wix.com/eppingvic/subodhabeauty
0433536097 subodhaastro@yahoo.com.au